# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2056/36 – 2018 පෙබරවාරි 01 වැනි බ්‍රහස්පතින්දා – 2018.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 33 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2017/යූඩී/174.

ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කේඩීඑස්/පීඩීබී/4/3/10(III).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජනවාරි මස 30 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
1200/6,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, පාතදුම්බර

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, නාපාන ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මහ/පීටීඩී/2017/568 සහ 2017.11.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 'ඒ' – ඒදණ්ඩකුඹුර වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0028**
උතුරට: මාර්ගය(මා.සං.අ.); නැගෙනහිරට සහ දකුණට: මාර්ගය; බටහිරට: ඩී. එම්. පුෂ්පරේඛා හිමිකම් කියන ඒදණ්ඩ කුඹුර වත්ත සහ මාර්ගය (මා.සං.අ.).

02-533

1A – G27050 – 62 (2018/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 34 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2015/යූඩීඒ/159.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය:ඊඑච්ඊ/ඩීඑස්/එල්එන්ඩී/05/ඒසීකිව්/යූඩීඒ/04.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජනවාරි මස 26 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, ඇහැළියගොඩ

2. **ඉඩමේ විස්තරය.–** සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලෙපත්තුව සුළු කොට්ඨාසයේ, කැන්දන්ගමුව නගරය (අ.ග.පි. 691) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ආර්/ඊඑච්එල්/2015/994 සහ 2016.06.17 දිනැති පුගමණ අණුරේඛනයේ සවිස්තරව සඳහන් ඉඩම්කැබලි වලට මායිම්:

01. **කැබලි අංක 'ඒ' – පුස්සැල්ලගේහේනේදෙනිය – ප්‍රමාණය: හෙක්. 0.4351**

උතුරට: ඇහැළියගොඩ ප්‍රාදේශීය සභා භූමිය සහ ර/ඇහැළියගොඩ මධ්‍ය මහා විද්‍යාලය පිහිටි පුස්සැල්ලගෙහේනේවත්ත; නැගෙනහිරට: ර/ඇහැළියගොඩ මධ්‍ය මහා විද්‍යාලය පිහිටි පුස්සැල්ලගෙහේනේවත්ත සහ කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අංක බී, එල්. ආර්. ධර්මසිරි සහ තවත් අය හිමිකම් කියන පුස්සැල්ලගෙහේනේදෙනිය සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: එල්. ආර්. ධර්මසිරි සහ තවත් අය හිමිකම් කියන පුස්සැල්ලගෙහේනේදෙනිය, මාර්ගය (මා.සං.අ.) සහ ඇහැළියගොඩ ප්‍රාදේශීය සභා භූමිය පිහිටි පුස්සැල්ලගෙහේනේවත්ත.

02-534

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1958/61 හා 2016.03.18 වැනි දින දරන *රජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2016 අංක 42 හා 2016.03.15 වැනි දින දරන ආඥාවේ මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තරව දක්වා ඇති ඉඩම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් එකී ඉඩම් කොටසේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවමත් භාරගෙන නැත. එබැවින් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1958/61 හා 2016.03.18 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත සඳහන් 20169 අංක 42 හා 2016.03.15 දින දරන ආඥාවේ ඇතුලත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වෙන ඉඩම් කොටස මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/12/2014/යූඩීඒ/398.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කේඩීඑස්/ටීයූඑම්/04/01/09.
2018 ජනවාරි මස 30 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපළාත කෝරළේ නැගෙනහිර සුළු කොට්ඨාසයේ, ගලගෙදර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/ටීඑම්පී/2015/01 හා 2015.06.23 වැනි දින දරන පුගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුතු ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – හිත්ගහතැන්න වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0910 ක් පමණ**

උතුරට: සුනිමල් වෙලගෙදර හිමිකම් කියන හිත්ගහතැන්න වත්ත; නැගෙනහිරට: ප්‍රදේශීය සභාව හා රජය හිමිකම් කියන හිත්ගහ තැන්න වත්ත; දකුණට: මාර්ගය (ප්‍රාදේශිය සභාව); බටහිරට: රජය හිමිකම් කියන හිත්ගහ තැන්න වත්ත.

02 – 535